මොරටුව මහා නගර සභාව

පුරප්පාඩු දැන්වීම

මොරටුව මහා නගර සභාවේ ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත

පෙදරේරු සේවය ලබා ගැනීම

මොරටුව මහා නගර සභාව වෙත මාස 06ක කාලයක් සඳහා ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත පෙදරේරුසේවයලබා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

මේ සමඟ ඉදිරිපත් කර ඇති ආදර්ශ අයදුම්පත්‍රය ප්‍රකාරව ඔබ විසින් සකස් කරන ලද අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු අතර, අයදුම්පත් බහාලන කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි " ශ්‍රම මිලදී ගැනීම් - පෙදරේරු"ලෙස සඳහන් කර 2026.12.01 දිනට ප්‍රථම නාගරික කොමසාරිස්, මොරටුව මහා නගර සභාව, මොරටුව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

I. තනතුර - පෙදරේරු (ශ්‍රම මිලදී ගැනීමේ පදනම)

II. දීමනාව - වැඩ කරන එක් දිනක් සඳහා රු. 4200/- කි. (පැය 08ක කාලය)

III. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් - පෙරේරු වෘත්තියට අදාළව වසර 03ක පළපුරුද්ද

IV. කායික සුදුසුකම් - තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

V. වෙනත් සුදුසුකම් -

I. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අවසන් දිනට අවම වශයෙන් වසර 03ක් බස්නාහිර පළාතේ ස්ථීර පදිංචිය සනාථ කළ යුතුය. (මොරටුව මහා නගර සභා බල ප්‍රදේශය තුල පදිංචි අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ. ග්‍රාම නිලධාරි සහතිකයක් මඟින් පදිංචිය සනාථ කළ යුතුය.)

II. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුයි.

III. අයදුම්කරු යහපත් චරිතයකින් යුක්ත විය යුතුයි.

IV. තනතුර සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේසඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

VI. ශ්‍රම මිලදී ගැනීමේ ක්‍රමය - සුදුසුකම්ලත් සේවකයින් පහත කොන්දේසිවලට යටත්ව සේවය ලබා ගනු ලැබේ.

i. වෘත්තීය හැකියාව පිළිබඳව ප්‍රායෝගික පරීක්ෂණයකින් / රජයේ වෘත්තීය මාර්ගෝපදේශන ආයතනයක නිර්දේශ මත සුදුස්සන් තෝරා ගැනීම

II. ඔබ වැඩ කරන දින ගණන සඳහා පමණක් අදාළ දීමනාව ඊළඟ මස පළමු සතිය තුල දී ගෙවීම් කරනු ලබයි.

III. සේවයේ අවශ්‍යතාවය මත සෙනසුරාදා, ඉරිදා හා රජයේ නිවාඩු දිනවල කැඳවීම් කරනු ලැබුවහොත්, සේවය කිරීමට ඔබ බැඳී සිටිය යුතුයි.

IV. තෝරා ගනු ලබන අයදුම්කරුවන් මොරටුව මහා නගර සභාව සමඟ ගිවිසුමකට එළඹිය යුතුයි.

- අයදුම්පත් භාර ගන්නා අවසාන දින වන 2026.12.01 දිනට අවශ්‍ය සියළුම සුදුසුකම් සපුරා තිබිය යුතුය.
- අදාළ සේවා ලබා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය මොරටුව මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතු වේ.

නාගරික කොමසාරිස්,
මොරටුව මහා නගර සභාව,
මොරටුව.
2026.11.02

<u>මොරටුව මහා නගර සභාවේ</u>

<u>පෙදරේරු තනතුර සඳහා ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත සේවයේ යෙදවීමේ අයදුම් පත්‍රය</u>

1. <u>ජීව දත්ත තොරතුරු</u>

1.1 අයදුම්කරුගේ මුලකුරු සමඟ නම : (උදා - සිල්වා ඒ.බී.සී.)

.....

1.2 සම්පූර්ණ නම

.....

.....

1.3 ස්ථිර ලිපිනය : .....

.....

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : .....

1.5 දුරකථන අංකය : .....

1.6 උපන් දිනය : වර්ෂය :..... මාසය ..... දිනය .....

1.7 2025.....දිනට වයස : අවුරුදු ..... මාස ..... දින .....

1.8 අධ්‍යාපන සුදුසුකම් :

1. .....
2.

1.9 **<u>වෘත්තීය සුදුසුකම්</u> :** .....

.....

(සැලකිය යුතුය - අයදුම්පත්‍රය සමඟ ජාතික හැඳුනුම්පතෙහි සහතික කල පිටපතක් සහ අධ්‍යාපන සහතික හා වෘත්තීය සුදුසුකම් සනාථ කිරීමට අදාළ (N.V.Q.සහතික) සහතික කල පිටපතක් අමුණා එවිය යුතුය.)

<u>අයදුම්කරුගේ සහතිකය :</u>

මෙම ඉල්ලුම් පත්‍රයේ මවිසින් සපයන ලද තොරතුරු සත්‍යවුත්, නිවැරදි වුත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මා මෙම සේවය සඳහා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත් වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැන ගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මා දනිමි.

.....

අයදුම්කරුගේ අත්සන

දිනය : .....

සැ.යු. :- නිවැරදිව සම්පූර්ණ නොකරන ලද අයදුම්පත්, අදාළ සුදුසුකම් සනාථ කිරීමේ ලියවිලි අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.